# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1829/35 – 2013 සැප්තැම්බර් 26 වැනි බ්‍රහස්පතින්දා – 2013.09.26**

**(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/65/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්

කේ. සී. ද සිල්වා මයා, අංක 27ඒ, ඩී. ඩබ්. ජේ. පෙරේරා මාවත, උයන්කැලේ, පානදුර.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

මාර්ග සංවර්ධන අධිකාරිය, 'සෙත්සිරිපාය', බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

රත්මලාන, සිරිමල් උයන, අරලිය මාවත, අංක 3 හි, ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/65/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්

කේ. සී. ද සිල්වා මයා, අංක 27ඒ, ඩී. ඩබ්. ජේ. පෙරේරා මාවත, උයන්කැලේ, පානදුර.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

මාර්ග සංවර්ධන අධිකාරිය, 'සෙත්සිරිපාය', බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය** වනුයේ,

මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්මික නිලධාරියෙකු ලෙස සේවය කරන කේ. සී. ද සිල්වා මහතාට එරෙහිව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පවත්වන ලද විනය පරීක්ෂණයක් මගින් ලබාදී ඇති දඬුවම් යුක්තිසහගතද යන්න හා එසේ නොමැති නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 – 343

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.